

# පමා නොවී එමී අකුරට

රසික සූරියආරච්චි ලියයි

ඉංගිරිසි උගත්තොත් රැකියා ප්‍රශ්ණය විසඳෙනැයි කියන්නේ නූගත් දේශපාලඥයින් පමණක් නොවේ. උගත් මහාචාර්යවරු ද එම වරදම කරති.
එක්තරා විශ්ව විද්‍යාලයක පලමු වසර සිසුන් පිළිගැනීම සඳහා පැවැත්වුණු ආරම්භක උත්සවයක දී පීඨාධිපති මහාචාර්යවරයා ප්‍රකාශ කලේ හොඳ උපාධියකුත් මනා ඉංගිරිසි දැණුමකුත් ඇතිනම් විශ්ව විද්‍යාල අධ්‍යාපනය අවසානයේ අනිවාර්යයෙන්ම රැකියාවක් ලබා ගත හැකි බවයි. ඔහු ගේ එම ප්‍රකාශය, විශ්ව විද්‍යාලයේ පලමු වසර ආරම්භ කරන සිසුන් දිරිමත් කිරීමට කළ ප්‍රායෝගික එකක් මිස සර්ව සත්‍යයක් නොවේ. මක් නිසාද යත්, මනා ඉංගිරිසි දැනුම යනු සීමිත රැකියා සංඛ්‍යාවක්

## සුද්දට පාර කියූ හැටි

සඳහා සුදුස්සන් විශාල අයැදුම්කරුවන් පිරිසක් අතරින් තෝරා ගැනීමේදී භාවිතා කෙරෙන එක් නිර්ණායකයක් විනා රැකියාවක් අනිවාර්යයෙන් ලබාදෙන මැජික් යෂ්ඨියක් නොවීමයි.
ඉංගිරිසි ඉගෙනීම නිසා රැකියා අවස්ථා වැඩිවේ නම්, භූගෝල විද්‍යාව ඉගෙනීම නිසා ද ඒ ආකාරයෙන් ම රැකියා අවස්ථා වැඩිවේ. ඒ රැකියා සියල්ල ඉංගිරිසි හෝ භූගෝල විද්‍යා උගන්වන ගුරුවරුන් සඳහාය.

අද ලංකාවේ ප්‍රාථමික පාසල්වල දෙමල භාෂාව උගන්වන නිසා, දෙමල ඉගැන්විය හැකි ගුරුවරුන්ට පාසල්වලද, ටියුෂන් ව්‍යාපාරවලද අළුතින් රැකියා බිහිවී ඇත්තේ ද මේ ආකාරයට ය.
අපේ මහාචාර්යවරයා කියූ ප්‍රකාශය සත්‍යයක් නම් ඕස්ට්‍රේලියාව, එංගලන්තය වැනි රටවල්වල් වල වසන හොඳින් ඉංගිරිසි දන්නා අය අතර විරැකියා ප්‍රශ්ණයක් තිබිය නොහැක. මේ රටවල හිඟන්නෝ පවා මනා ලෙස ඉංගිරිසියෙන් කතාබහ කරනවා නොවැ!
අප කුඩා කල ඉංගිරිසිය ඉගෙනීම ඇරඹුනේ තුන්වන ශ්‍රේණියේ දී, "සී.ඒ.ටී. කැට්" සහ "ආර්.ඒ.ටී. රැට්" සමගිණි. පන්තියේ අන් සියළුම විෂයයන් පන්තිය භාර ගුරුතුමිය විසින් ඉගැන්වෙද්දී, ඉංගිරිසි සඳහා පමණක් වෙනම ම "සර්" කෙනෙකු පන්තියට පැමිණියේය. පාසලේ පන්ති දසයකට ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා සිටියේ මේ ආකාරයේ සර් ලා දෙදෙණෙකු පමණක් වුවද, අපේ ඉංග්‍රීසි සර් ඉංග්‍රීසි ඉගැන්වීමට අමතරව අපේ විෂයය නිර්දේශයේ තිබූ වතුවැඩ විෂයයද භාරව සිටි නිසා, ඔවුන් ගේ ඉංග්‍රීසි ඉගැන්වීමේ සේවය පාසලට කෙතරම් අවශ්‍ය වූයේ ද යන්න පෙනීයයි.
අද ද, මොරටුවේ එක් කණිෂ්ඨ පාසලක සේවය කරන ඉංග්‍රීසි ගුරුවරුන් දෙදෙනාම ඒ සමගම චිත්‍ර විෂයයද උගන්වති.
තුනේ වසරෙන් ඇරඹුනු අපේ ඒ ඉංගිරිසි ඉගෙනුම කෙලවර වූයේ අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙනි. මේ කාලය ඇතුලත පාසල් පොත් සහ ඒවායේ ඇති කියවීම් සහ ලිවීම් අභ්‍යාස මගින් භාෂාවේ ව්‍යාකරණ විධි ද, අනෙකුත් භාෂා ප්‍රයෝගද සමග හොඳ දැණුමක් සිසුන්ට ලැබිය යුතු විය. එනමුදු රජයේ විභාගයේ දී වාක්‍ය රචනා ලිවීම තබා ව්‍යාකරණානුකූලව එක් වාක්‍යයක්වත් ගොඩ නගා ගත හැකි දැනුමක් ඇතිකර ගන්තේද දුරාවාරේ සිසුවෙක් පෙමණක් විය.
මා ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයට මුහුණ දුන් 1976 වසරේ, අද මෙන් ඉංගිරිසි ටියුෂන් ව්‍යාපාර රට පුරා තිබුනේ නැත. වෙනත් විෂයයන් සඳහාද තත්වය එලෙසම විය. මගේ දැනුම සීමා වූයේ පන්තියේ දී කළ අභ්‍යාසයන්ට හා නිවසේ දී අතිශයින්ම අවශ්‍යතාවය මත පමණක් තාත්තාගෙන් අසා දැනගත් කරුණු වලට පමණි.

මේ වාතාවරණය යටතේ අපේ විභාග ප්‍රතිපල නිකුත්වූ විට පන්තියේ සිටි තිස් දෙනෙක් පමණ සිසු සිසුවියන්ගෙන් පස් දෙනෙක් පමණක් ඉංගිරිසි විෂයය සමත් වී තිබෙනු දැකීම පුදුමක් නොවීය. වඩාත් ම කණගාටුදයක කරුණ වූයේ විශිෂ්ඨ සාමාර්ථයක් ලබාගත් සිසුවා හැරෙන්න අන් සියළුම පිරිමි ළමුන් ඉංගිරිසි විෂයය අසමත් වී තිබීමයි. විභාගය සමත් වූ ගැහැණු ළමුන් සිව්දෙනා අතරද සම්මාන සාමාර්ථයන් තිබුනේ එකක් පමණි.
එද පැවති ඒ ශෝකජනක තත්වයට හේතුව සම්පත් අඩුකම මෙන්ම සැබෑ අවශ්‍යතාවයක් නොමැතිකමද වී යැයි සිතමි. තාත්තා කියවන පොත් අතරින් අඩුතරමේ ජේම්ස් හැඩ්ලි චේස් ගේ නවකතා කෙදිනක හෝ කියවමිය කියා මිස මා තුල වුවද ඉංගිරිසිය හොඳින් ඉගෙනගන්නට අමුතු උනන්දුවක් නොවීය. නමුත්, රට හැමතැන ටියුෂන් කඩ පැතිරී ඇති, ඉංගිරිසිය නමැති "පුදුම පහණ" ගැන රටම හොඳින් දන්නා අද වුවද මේ තත්වයේ වැඩි දියුණුවක් වී නොමැති බව සංඛ්‍යා ලේඛණ සාක්ෂි දරයි.

අකුරු ගැටගසා වචන ද, වචන ගැට ගසා වාක්‍ය ද තටමමින් නිපදවා ලිවීමට හැකියාව ලබාගත හැකි වූවද, ඉන් ඔබ්බට ගොස් ඒ වාක්‍යයක් තැනට ගැලපෙන පරිදි සිත තුල සකසා දෙබසක කොටසක් ලෙසින් කීම හෙවත් ඉංගිරිසියෙන් කතා කිරීම වනාහී වෙනමම බෝල ක්‍රීඩාවකි. මට මෙය සැබවින්ම වැටහුනේ පසු කලෙක ආනන්ද විද්‍යාලයේ එකොලොස් වෙනි ශ්‍රේණියේ ඉගෙනුම ලබමින් සිටියදී මුහුණ දුන් එක්තරා සිදුවීමක් තුලිණි.

එදින මම මරදාන දුම්රිය ස්ථානය දක්වා පා ගමණින් යමින් සිටියෙමි. මේ මග දෙපස පිරී ඇත්තේ ලී බඩු වෙළඳ ශාලාවෙන් සහ පොත් කඩ වලිනි. අතරින් පතර තෝසේ කඩ කිහිපයක් ද විය. සැමද දැක පුරුදු මේ අසිරි සිරි නරඹමින් සැනසිල්ලේ ඉදිරියට ඇදුණු මා දුටුවේ, කොට කලිසමකින්ද, අත්කොට කමිසයකින්ද, රවුම් උපැස් යුවලකින්ද සැරසී ගමන් මල්ලක් උරහිස රඳවාගෙන සිටි විදේශීය සංචාරකයෙකු බව බැළු බැල්මට පෙනෙන, සුදු ජාතිකයෙකු මා ඉදිරිපස සිටින බවයි.

ඔහු මගහැර යන්නට මා සැරසෙනවාත් සමගම, මට ඇසුනේ ඒ විදේශිකයා මා අමතන හඬයි.

ඔහු එවෙලේ මට කියූ වදන් ඒ ආකාරයෙන්ම අද මගේ මතකයේ නැතිවුනත්, පැහැදිලිව උච්ඡාරණය කරමින් කතා කළ නිසා දෝ ඒ විදේශිකයා මගෙන් අසන්නේ, "ටවුන් හෝල්" නමින් හැඳින්වෙන පුරහල අසලට යා හැක්කේ කෙසේද කියා බව මට පැහැදිලි විය.

මරදානේ සිට පුරහලට යන හැටි නොදන්නේ කවරෙක්ද?
නමුත් සැබෑ ප්‍රශ්ණය නම් අතැඹුලක් සේ දන්නා ඒ මාර්ග විස්තරය ඇඟ ඇතුලේදී සිංහලෙන් ඉංගිරිසියට පෙරලා කටෙන් එලියට දමාගන්නේ කෙලෙසද යන්නයි.

තටමන්නට වෙලා නැත. පැකිලෙන්නට වෙලා නැත. නමුත් තත්පරයක් දෙකක් පමණ ගතවෙන්නට ඇත. සුද්ද මා දෙස බලා සිටියි. මේ කාලය ඇතුලත තුන්වැනි ශ්‍රේණියේදී සමරසිංහ සර්ගෙන් උගත් "සී.ඒ.ටී. කැට්" සහ "ආර්.ඒ.ටී. රැට්" ගේ සිට දහවැන්නේ දසනායක ටීචර්ගෙන් උගත් ක්‍රියාපද වර නැගීම් දක්වා දහසකුත් එකක් දේ මා සිත තුල කැළඹෙන්නට ඇත.

ඒ ක්‍රියාවලිය අවසානයේ මා මුවඟින් පිටතට ආවේ ඒ අවස්ථාවට ඉතාමත් ගැලපෙන වදන් කිහිපයකි.
"අයි ඩෝන්ට් නෝ!"

මුහුණ බෙරිකරගත් සුද්ද ඉවතට ඇදී ගියේය. ඔහු හිතන්නට ඇත්තේ මා කියුවේ "ටවුන් හෝල්" නොහොත් පුරහලට යන අයුරු මා නොදන්නවාය කියා විය යුතුය. නමුත් මා ඇත්තටම කීවේ පුරහලට යන මාර්ගය ඉංගිරිසියෙන් විස්තර කර පවසන්නට මා නොදන්නා බව පමණි!

ඔන්න සුද්ද බොරැල්ලට යන ක්‍රමය වත් ඇසුවා නම් ඉද්ද ගැසුවා සේ ඇදෙන මාර්ගය පෙන්වා අතින් පයින් හෝ ගමන් විස්තරය කියා දෙන්නට තිබුණි.

ඒ ඒ ශ්‍රේණියට නියමිත පාඩම් පොතෙන් වැඩි කොටසක් හැදෑරුවද, ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයට අතිසාර්ථකව මුහුණ දුන්නද, ඉංගිරිසියෙන් කතා බහක යෙදෙන ප්‍රායෝගික අවස්ථාවක් ඒ කිසිවක් තුලින් අපට උදා නොවූ බව මට ඒ මොහොතේ සිහිවිය.
වසර දෙකකට පමණ පසු උසස් පෙල විභාගය අවසානයේ එළැඹුණු ගන්ධබ්බ සමයේ දී මම " ලාල් සර්" ගේ "ස්පෝකන් ඉංග්ලිෂ්" පන්තියට බැඳුනෙමි.

*(මෙම සිද්ධිය මත පදනම් වූ වෙනත් ආකාරයක රචනයක් මීට පෙර අන්තර්ජාලයේ kathandara.blogspot.com අඩවියේ පල කෙරුණු බව කරුණාවෙන් සලකන්න).*




A MESSAGE FROM
MICHAEL STOVE,
YOUR LABOR CANDIDATE IN THE SEAT OF BEROWRA

My name is Michael Stove and I have been endorsed as your Australian Labor Party candidate for the seat of Berowra.

By way of introduction, I am 49 years of age, and I have lived in Beecroft for 16 years. I am married with four children who all attended local schools and I work as a Continuous Improvement Manager with a major international airline.

I have worked in the aviation industry for over 32 years. This experience, together with longstanding active participation in community organisations like Landcare, the Beecroft Cheltenham Civic Trust, the Scout movement and soccer coaching have helped me appreciate the quality of life and opportunities we have in Australia.I am not a career politician. My wife and I have faced the same issues with which most families in the electorate of Berowra have been confronted - job security, the need to provide quality education for our children, access to quality, affordable healthcare and confidence in Australia's future standards of living.

It is with these concerns in mind that I am committed to helping the Rudd Government to be re-elected, the Rudd Government which :-

Acted decisively and responsibly to managed the Australian economy during the Global Financial Crisis while simultaneously keeping our level of debt to GDP down to one of the lowest in the world;

obtained agreement to implement $5 billion in national health reforms including 1300 new hospital beds, 2000 mental health places, 6000 new doctor training places and 2500 aged care beds;

introduced national curriculum's for schools as well as implemented the largest program for improving school infrastructure in the nation's history (including improvements to schools in the Berowra electorate);

was the first national Australian Government to begin addressing the question of what is a sustainable population for our nation and what infrastructure is required to support it.

I will be using the coming months to meet and listen to as many Berowra voters as possible.

Sincerely,
**Michael Stove**
Labor Candidate for Berowra



ABN 399 885 48425

SRI WRECK
TOWING



VEHICLE TRANSPORT
BREAKDOWNS
FREE OLD CAR REMOVALS
RELIABLE RATES
TILT TRAY TRUCK
ALL AREAS

24 hours 7 days a week

0433 495 548

udesha@bigpond.com Tel 5995 6105